# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 27 දරන ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1992 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

## 1992 අංක 27 දරන ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 76/90

### ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ වූ සියලු පරමාර්ථ හා කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ගල්කිස්සේ, ටෙම්ප්ලර්ස් පාරේ ශ්‍රී විමලසිරි මාවතේ, ශ්‍රී සුගත ධර්මායතනයේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 27 දරන ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන්පසුව ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම නමින් හඳුන්වනු ලබන පදනමේ දැනට සාමාජිකයන් වන්නා වූ හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මෙහි මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු 'පදනම' යනුවෙන් හඳුන්වන ලබන) "ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එය විසින් පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ පාවිච්චි කිරීමේද එය තම කැමැත්ත පරිදි වෙනස් කිරීමේද සම්පූර්ණ බලය සහ අධිකාරය ඇතිව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය. — ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධ ප්‍රතිපත්තිවලට අනුකූලව මනුෂ්‍යයාගේ අධ්‍යාත්මික සහ භෞතික සංවර්ධනය නංවාලීම ;

(ආ) මානව දයාවෙන් යුත් සමාජයක් බිහි කිරීම සහ ඒ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඇ) චරිතය හැඩ ගැස්වීමට ඉවහල් වන පරිසරයක් ඇති කිරීම උදෙසා කටයුතු කිරීම ;

(ඈ) දහම් පාසැල්, ළදරු පාසැල් සහ පුස්තකාල පිහිටුවීම සහ ළමයින්ගේ සදාචාරාත්මක සංවර්ධනය දියුණු කිරීම සඳහා පියවර ගැනීම ;

(ඉ) තරුණියන්ට රැකියා ලබා ගැනීමට අවශ්‍ය වන දක්ෂතා ඔවුන්ට ලබාදීම;

(ඊ) රැකියා ලබා ගැනීම සඳහා හෝ ස්වයං රැකියාවල නියුක්ත වීම සඳහා තරුණයන්ට පුහුණුව ලබා දීම;

(උ) ළමයින්ට, තරුණයින්ට සහ වැඩිහිටියන්ට සදාචාරාත්මක මාර්ගෝපදේශකත්වය සැලසීම සහ ශිෂ්‍යයන්ට ආධාර කිරීම;

(ඌ) අසරණයන්ට පිහිට වීම;

(එ) සෑම ජන කොටසක් අතරම සමගිය ඇති කිරීම; හා

(ඒ) සංස්කෘතික සහ වෙනත් ක්‍රියාකාරකම්වල නියුක්තවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් දේ ඇතුළුව, අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන්‍ය ආකාරයකින් ත්‍යාග, ප්‍රදානයන්, පරිත්‍යාගයන්, ආධාර සහ සම්මාදම් භාර ගැනීම හෝ එකතු කිරීම;

(ආ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම හා ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඇ) සංස්ථාව සතු වී ඇති හෝ සංස්ථාවට අයිති අරමුදල් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ කාර්ය සඳහා ප්‍රමාණවත් සුරැකුම්වල ආයෝජනය කිරීම හෝ අවශ්‍ය ඉඩම්, ගොඩනැගිලි, බඩු, චංචල දේපළ හෝ වෙනත් දේපළ මිලදී ගැනීම සඳහා හෝ අත් කර ගැනීම සඳහා ආයෝජනය කිරීම;

(ඈ) සංස්ථාවට අයිති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයක් ඉදි කිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම;

(ඉ) කෘෂිකර්මය, කලා සහ ශිල්ප, වෙළඳ, වාණිජ සහ කාර්මික ව්‍යාපාර ආදියෙහි සේවා නියුක්තිය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ආයෝජන කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය වන වියදම් දැරීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය වන නිලධාරීන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම.

5. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් භාර ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව සහ බලය සංස්ථාවට ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත් ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. ශ්‍රී සුගත ධර්මායතනයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද, ඒ රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද වෙනත් නිලධරයන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලැබූ තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

7. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී තත් කාලයේ ශ්‍රී සුගත ධර්මායතනයේ විහාරාධිපති ධූර දරන ස්වාමීන් වහන්සේ මෙම සංස්ථාවේ අනුශාසක හා විධායක අධ්‍යක්ෂවරයා විය යුතු ය.

අනුශාසක හා විධායක අධ්‍යක්ෂ.

(2) දිවයිනෙන් බැහැරව ගොස් සිටීම හෝ ක්‍රියා කිරීමට නොහැකියාව හේතුකොට ගෙන අනුශාසක හා විධායක අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා හෝ උන්වහන්සේ විසින් නම් කරනු ලබන ශිෂ්‍යයා අනුශාසක හා විධායක අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ වෙනුවට ක්‍රියා කර උන්වහන්සේ කළ සියලු ම කාර්යයන් ඉටු කළ යුතු ය.

8. සංස්ථාවට උපදේශක මණ්ඩලයක් සිටිය යුතු ය. එම උපදේශක මණ්ඩලයේ සාමාජිකයන් මෙම පනත යටතේ සාදනු ලැබූ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගත යුතු ය.

උපදේශක මණ්ඩලය.

9. (1) සංස්ථාව විසින් කලින් කල තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. තවද විශේෂයෙන්ම සහ ඉහත සඳහන් බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම එකී රීති මගින් කරනු ලැබිය හැකි ය :—

සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම සහ සාමාජික ගාස්තු ;

(ආ) සංස්ථාවේ සහ පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ එම රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යයන් පාලනය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පදනමේ වලංගුව බල පැවැත් වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීති යක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ එවකට බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශ යෙන්, එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

නිලධාරීන් තෝරා පත් කර ගැනීම.

11. මෙම පනත ක්‍රියාත්මක වීමෙන් එක් මසක කාලයක් ඇතු ළත අනුශාසක හා විධායක අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ විසින් කැඳවනු ලබන මහා සභා රැස්වීමකදී සංස්ථාව විසින් සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාවේ ප්‍රථම නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගත යුතු ය. ඉන්පසුව නිලධාරීන් තෝරා පත් කර ගත යුත්තේ මෙම පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේ දී ය.

පදනමට ලැබිය යුතු සහ පදනම විසින් ගෙවිය යුතු ණය.

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේදී පදනම විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතේ සඳහන් වූවන්ගේ හෝ ඔවුන් මගින්, ඔවුන් ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැක.